# Peel District School Board, පීල් දිස්ත්‍රික්ක පාසැල් මණ්ඩලයෙහි විශේෂ අධ්‍යාපනය
# Identification, Placement and Review Committees
# හඳුනාගැනීමේ, ස්ථානගත කිරීමේ සහ නැවත පරීක්ෂා කිරීමේ කමිටුව
# IPRC (අයි.පී.ආර්.සී.)

# A Guide for Parents
## දෙමාපියන්ට අත් පොතක්

### Identification, Placement and Review Committee, හඳුනාගැනීමේ, ස්ථානගත කිරීමේ සහ නැවත පරීක්ෂා කිරීමේ කමිටුවක් යනු කුමක්ද?

විවිධ සිසුන් වර්ධනය වන්නේ සහ ඉගෙන ගන්නේ විවිධ ආකාරයෙනි. සමහර සිසුන්ට සාමාන්‍ය පංති කාමරය තුලින් තම අවශ්‍යතා සපුරා ගත නොහැකි වනු ඇත. කමිටුවක ආධාර ඇතිව Peel District School Board, පීල් පාසැල් මණ්ඩලය මෙම සිසුන්ට සහය දීමේ වගකීම භාරගෙන ඇත.

- විශේෂ අධ්‍යාපන වැඩ සටහන්, සහය හෝ සේවාවන් අවශ්‍ය සෑම සිසුවෙකුම හඳුනා ගැනීම.
- සිසුවාගේ අවශ්‍යතාවයන්ට අනුව ඔවුන්ව වැඩ සටහන් වලට ඇතුලත් කිරීම.
- සිසුවාගේ ප්‍රගතිය පිළිබඳව නිරීක්ෂනය කිරීම

Identification, Placement and Review Committees (IPRC), හඳුනාගැනීමේ, ස්ථානගත කිරීමේ සහ නැවත පරීක්ෂා කිරීමේ කමිටුවෙහි (අයි.පී.ආර්.සී) පාසැල් විදුහල්පති, විශේෂ අධ්‍යාපන ගුරුවරයකු හෝ දෙපාර්තුමේන්තු ප්‍රධානියකු සහ පංති භාර ගුරුවරයකු ආදී අයගෙන් සමන්විත කුඩා කණ්ඩායමක් ඇතුලත්වේ. යම් අවස්ථාවල මනෝ වෛද්‍යවරයකු, කථාව-භාෂාව පිළිබඳ විශේෂඥයකු ආදී නිපුනයන් කමිටු රැස්වීමකට සහභාගිවේ. කමිටුවේ ඉලක්කය වන්නේ ඔබ සමඟ එක්වී ඔබේ දරුවාගේ අධ්‍යාපනය පිළිබඳව ගත හැකි හොඳම තීරණ ගැනීමයි.

### කමිටුවට සිසුවෙකු නිර්දේශ කරන්නේ කවුරුන්ද?

ඔබේ දරුවාගේ පාසැලෙහි විදුහල්පති විසින් යොමු කිරීම කරන අතර ඒ බව ඔබට ලිඛිතව දැනුම් දේ. ඔබ, ඔබේ දරුවාගේ අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත්ව සිටී නම් ඔබටද මෙම යොමු කිරීම කරන ලෙස ලිඛිතව විදුහල්පතිගෙන් ඉල්ලුම් කල හැක. අවම වශයෙන් පාසැල් දින 10 කට පෙර ඔබට කමිටු රැස්වීම පිළිබඳව දැනුම් දෙනු ඇත. ඔබ එම රැස්වීමට සහභාගි වීම වැදගත්ය. ඔබට සහභාගි වීමට නොහැකිනම් ඒ සඳහා වෙනත් දිනයක් සහ වෙලාවක් යොදා ගැනීම සඳහා කරුණාකර විදුහල්පති අමතන්න.

### රැස්වීමට පෙර කමිටුවට තිබෙන විස්තර මොනවාද?

පාසැල් සහ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් ඔබේ දරුවාගේ ඉගෙනීම පිළිබඳව කරුණු ගොනු කරනු ඇත. මෙයට ඔබේ දරුවාගේ අවශ්‍යතා පිළිබඳව ඇගයීම්, අධ්‍යාපනික ජයග්‍රහණ (පංති භාර සහ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් ගෙන්),

අදාල සෞඛ්‍ය විස්තර, සහ සාම්ප්‍රදායික ඇගයීම් (මනෝ වෛද්‍යවරයකු, කථාව-භාෂාව පිළිබඳ විශේෂඥයකු හෝ වෘත්තීමය සුදුස්සෙකු) ඇතුලත් වනු ඇත. ඔබටද මෙම විස්තර වල පිටපතක් ලැබෙනු ඇත.

**ඔබට මෙම රැස්වීමට සූදානම් විය හැක්කේ කෙසේද?**

ඔබ මෙම ක්‍රියාවලියෙහි සමාන කොටස් කරුවෙකි. රැස්වීමට පෙර සමහර විට ඔබට, ඔබේ දරුවාගේ හැකියාවන් සහ අවශ්‍යතාවයන් පිළිබඳව ලිඛිත විස්තර දැන්වීමට අවශ්‍ය වනු ඇත. එසේම ඔබට විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳව, වැඩසටහන් සහ සේවාවන්, ස්ථානගත කිරීම තෝරා ගැනීම පිළිබඳව සහ ඔබේ දරුවාගේ ලේඛන පිළිබඳව වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය වනු ඇත. මේ සඳහා ඔබේ පාසැලේ විදුහල්පති අමතන්න.

ඔබට, රැස්වීමේදී ඔබේ දරුවා වෙනුවෙන් පෙනී සිටීමට කෙනෙකු ගෙන ආ හැක. අවුරුදු 16 හෝ ඊට වැඩි සිසුන්ටද මෙයට සහභාගි විය හැක. මෙම රැස්වීමේදී ඉංග්‍රීසි භාෂාවෙන් කථා කිරීමට ඔබට අපහසු නම්, ඔබේ ඉල්ලීම මත පරිවර්ථකයකු සැපයීමට අපට හැක.

**කමිටු රැස්වීම තුලදී සිදුවන්නේ කුමක්ද?**

කමිටුව මගින් ඔබේ දරුවාගේ හැකියාවන් සහ අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳව, විශේෂ අධ්‍යාපනය අවශ්‍යද සහ වඩා සුදුසු වන්නේ කුමන ආකාරයේ ස්ථානගත කිරීමක්දැයි කියා සාකච්ඡා කොට පරීක්ෂා කරනු ඇත. ඔබද මෙම සාකච්ඡාවට සහභාගි වී ප්‍රශ්ණ ඇසිය යුතුය.

සාමාන්‍යයෙන් මෙම රැස්වීමට විනාඩි 20 ක පමණ කාලයක් ගතවේ. ඔබේ දරුවාට විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇතිද යන්න සහ විශේෂ අධ්‍යාපන ස්ථානගත කිරීමක් අවශ්‍යද යන්න පිළිබඳව කමිටුව මගින් එතැනදීම තීරණය කරනු ඇත. සමහරවිට කමිටුවට වැඩි විස්තර අවශ්‍ය නම් තීරණයක් ගැනීම කල් දමනු ඇත. නැවත රැස්වීමක් කැඳවනු ලබන අතර එයට සහභාගි වීමට ඔබට ආරාධනා කරනු ඇත.

විශේෂ අධ්‍යාපනයක් අවශ්‍යනම් ප්‍රථමයෙන්ම තෝරා ගන්නේ සිසුවා සාමාන්‍ය පංති කාමරය තුල සිටියදීම විශේෂ අධ්‍යාපන සහය ලබා දීමයි. එසේ කිරීම නොසුදුසු නම් දවසෙන් භාගයක පමණ කාලයක් සාමාන්‍ය පංති වලින් ඉවත් කර විශේෂ අධ්‍යාපන පංති වලට සහභාගි කිරීම ආදිය (තම පාසැලෙහි හෝ වෙනත් පාසැලක) ගතහැකි වෙනත් පියවර වලට ඇතුලත්වේ.

**කමිටුව රැස් වූවාට පසු කුමක් සිදුවේද?**

කමිටුවෙහි තීරණය පැහැදිළි කරමින් ඔබට ලිපියක් ලැබෙනු ඇත. ඔබ රැස්වීමට නොපැමිණියේ නම් තීරණය පිළිබඳව දැන්වීමට පාසැලෙහි විදුහල්පති ඔබව අමතනු ඇත. කමිටුව මගින් විශේෂ අධ්‍යාපන ස්ථානගත කිරීමක් නිර්දේශ කර ඇත්නම් ඔබට කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමයකට අත්සන් කිරීමට සිදුවේ.

ඔබට ගැටළු ඇති නම් කරුණාකර විදුහල්පති සමග සාකච්ඡා කරන්න. ඔබ තීරණයට එකඟ නොවන්නේ නම් ඒ පිළිබඳව කමිටුවට නැවත සලකා බලන්නැයි කියා ලිඛිතව අභියාචනා කල හැක. පාසැල් මණ්ඩලයේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඔබගේ අභියාචනය සහ එයට හේතු දක්වා පළමු කමිටු රැස්වීම පැවැත්වී දින 30 ක් ඇතුලත ලිපියක් යවන්න.

ඔබ කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමය පුරවා ඔබේ දරුවාගේ පාසැලට එවූ පසු අප ස්ථානගත කිරීම පිළිබඳව විධි විධාන යොදමු.

**ස්ථානගත කිරීමෙන් පසු ඔබේ දරුවාගේ අවශ්‍යතා ඉටු වනවාදැයි ඔබ දැන ගන්නේ කෙසේද?**

ඕනෑම පාඨමාලාවක සිටින සිසුවෙකුගේ සේම ඔබටද ප්‍රගති වාර්ථා ලැබෙනු ඇත, දෙමාපිය / ගුරුවර රැස්වීම් වලදී ගුරුවරයාට කථා කල හැක. එසේම වෙනත් අවස්ථාවල ඔබට ඉල්ලීමක් කර ඔවුන්ව හමුවිය හැක.

Individual Education Plan, පුද්ගලික අධ්‍යාපන සැලසුමක් වර්ධනය කිරීම තුලින් ඔබ, ඔබේ දරුවාගේ ප්‍රගතියට සහභාගි වනු ඇත. මෙය ඔබේ දරුවා විශේෂ අධ්‍යාපන ස්ථානගත කිරීම ආරම්භ කොට පාසැල් දින 30ක් ඇතුලත නිර්මාණය කල යුතුවේ. මෙම සැලසුමෙහි ඔබේ දරුවාගේ රුචිකම්, හැකියාවන්, අවශ්‍යතා සහ ඉලක්ක ඇතුලත් වන

අතර එමගින් ඔබේ දරුවාට සාර්ථක වීමට අවශ්‍ය විශේෂ අධ්‍යාපන වැඩ සටහන් හෝ සේවා සැපයීමට අපට ආධාර වනු ඇත.

ඔබේ දරුවා මාස 3ක පමණ කාලයක් ස්ථානගත වීමෙහි සිටි පසු ඔබට අවශ්‍ය නම් දරුවාගේ ප්‍රගතිය පිළිබඳව සොයා බැලීමට කමිටු රැස්වීමක් කැඳවන්න යැයි ඉල්ලුම් කල හැක. පාසැල මගින් අවම වශයෙන් වසරකට වරක් ඔබේ දරුවාගේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳව පරීක්ෂා කර බැලිය යුතුවේ.

අප විසින් යෝජනා කලහොත් හෝ ඔබ විසින් ඔබේ දරුවාගේ ස්ථානගතවීම පිළිබඳව හෝ ස්ථානය පිළිබඳව මාරු වීමක් ඉල්ලුම් කලහොත් අප නැවත පරීක්ෂා කර බැලීම සඳහා වාර්ෂික කමිටු රැස්වීමක් පවත්වමු.

**වැඩි විස්තර ලබා ගත හැක්කේ කෙසේද?**

Identification, Placement and Review Committee, හඳුනාගැනීමේ, ස්ථානගත කිරීමේ සහ නැවත පරීක්ෂා කිරීමේ කමිටුව සහ විශේෂ අධ්‍යාපනය පිළිබඳව වැඩි විස්තර දැන ගැනීමට:

- ඔබේ දරුවාගේ ගුරුවරයා හෝ විදුහල්පති සමඟ කථා කරන්න.
- ඔබේ දරුවාගේ පාසැලෙහි විශේෂ අධ්‍යාපනය භාර ගුරුවරයා අමතන්න.
- පීල් දිස්ත්‍රික්ක පාසැල් මණ්ඩලයේ (Peel District School Board) වෙබ් අඩවිය වෙත යන්න, www.peelschools.org/speced.
- ඔන්ටේරියෝ අධ්‍යාපන දෙපාර්තුමේන්තුවෙහි (Ontario Ministry of Education) ඇති www.edu.gov.on.ca වෙත ගොස් ප්‍රාථමික සහ ද්විතීය අධ්‍යාපනය තෝරා ගෙන විශේෂ අධ්‍යාපන පුරුක තෝරා ගන්න.
- දුරකථන අංක 905-890-1099 හෝ 1-800-668-1146 දිගු අංකය 2345 තුලින් පීල් දිස්ත්‍රික්ක පාසැල් මණ්ඩලය (Peel District School Board) අමතන්න.